# අනාත්මවාදී බෞද්ධ සිද්ධාන්තය ප්‍රකට කරන සච්චක සූත්‍රය

*- ආචාර්ය කරගස්වැවේ විමලානන්ද හිමි -*

සච්චක සූත්‍රය වූ කලී බෞද්ධයන්ගේ අනාත්මවාදී සිද්ධාන්තය[1] ස්ථාපනය කරවන දේශනයකි. සියලු සංස්කාර ධර්මයන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම[2] යන ත්‍රිලක්ෂණයෙන් සමන්වාගත වන බව ප්‍රකට කරවන්නකි. බමුණු දහමේ සත් - අසත් වාදයෙන් බැහැර කරවන්නකි. ජෛනාගමයේ[3] නිත්‍ය සිද්ධාන්තමය, මුක්තාත්මය, බද්ධාත්මය විසින් දක්වන ආත්මීයත්වය නිරස්ත කරවන්නකි. ප්‍රත්‍යක්ෂ ප්‍රමාණයෙන් ආත්මන් - බ්‍රහ්මන් පදාර්ථයන්හි ශූන්‍යත්වය විෂද කරවන්නකි. හේතු ප්‍රත්‍යයන්ගේ සාපෙක්ෂකත්වය ප්‍රධාන වන බැවින් පරිණාමවාදී ස්වරූපය ගත් සාංඛ්‍ය දාර්ශනික ඉගැන්වීම් ද ඉක්මවා යන්නකි. උච්ඡේද දෘෂ්ටියේත්, ශාශ්වත දෘෂ්ටියේත් ලෞකිකත්වය හා බැඳුණු අසාරත්වය අභිබවා සමස්තරූපී ක්ලේශ විධ්වංශනය ම සාංසරික දුඃඛාන්තය හෙවත් නිර්වාණය වන බව පලට කරවන්නකි.

මජ්ඣිම නිකායේ මූලපණ්ණාසකයට අයත් මහා යමක වග්ගයෙහි පස්වන සහ සවන සූත්‍ර පිළිවෙළින් චූළසච්චක සහ මහාසච්චක යනුවෙන් නම් කර ඇත. ආත්මය (අත්තා) විෂය කර ගනිමින් සච්චක නම් නුවට පුත්‍රයා බුදුරදුන් වෙත පැමිණ විමසා සිටියේ සිත සහ කය දියුණු කිරීම පිළිබඳවයි. ඔහු දැන සිටියේ හුදෙක් වැරදි මගින් සමාධිය දියුණු කරන ආකාරයයි. මෙහිදී බුදුරදුන් අනුගමනය කරන ලද

ආධ්‍යාත්මික අභ්‍යාස ක්‍රම ගැනත්, තමන් වහන්සේ නිවණ කරා යොමු වීමට හේතු වූ මධ්‍යම ප්‍රතිපදා මාර්ගය ගැනත් පැහැදිලි කළහ. සත්කාය දෘෂ්ටිය[4] පදනම් කරගත් චූල සච්චක සූත්‍රය දේශනා කරන ලද්දේ විශාලා මහනුවර කූටාගාර ශාලාවෙහිදීය. වාදකිරීමෙහි සමතෙකු වූ සච්චක දිනක් අස්සජී තෙරණුවන් හමු වී - භවත් ගෞතමයන් කෙසේ නම් තම ශ්‍රාවකයන් හික්මවා ද ශ්‍රාවකයන් බහුලව කුමන අනුශාසනාවක් කරාදැයි විමසීය.

*කථං පන හො අස්සජී සමණො*
*ගොතමො සාවකෙ විනෙති කථම්භාගා*
*ච පන සමණස්ස ගොතමස්ස*
*සාවකෙසු අනුසාසනී බහුලා*
*පවත්ති තී' ති*

සච්චකගේ ප්‍රශ්නයට පිළිතුරු දෙන අස්සජී තෙරණුවෝ

රූපං භික්ඛවේ අනිච්චං, වේදනා අනිච්චා,
සඤ්ඤා අනිච්චා, සංඛාරා අනිච්චා,
විඤ්ඤාණං අනිච්චං, රූපං භික්ඛවෙ
අනත්තා, වේදනා අනත්තා, සඤ්ඤා අනත්තා
සංඛාරා අනත්තා, විඤ්ඤාණං අනත්ත
සබ්බේ සංඛාරා අනිච්චා
සබ්බේ ධම්මා අනත්තා ති.

මහණෙනි, රූප අනිත්‍යයි...... විඥඥාණ අනිත්‍යයි, මහණෙනි, රූප අනාත්මයි............ විඥඥාණ අනාත්මයි. සියලු සංස්කාර අනිත්‍යයි. සියලු ධර්ම අනාත්මයි යනු වෙනැයි පිළිතුරු දෙති.

වාද කිරීමෙහි ගර්වයෙන් යුත් සච්චක අස්සජී තෙරණුවන්ගෙන් පිළිතුරු ප්‍රමාණ කර නොගෙන ස්වකීය මතය ගත් ලිච්ඡවීන් ද කැටුව



තථාගතයන් වහන්සේ වෙත පැමිණ වාද කරන්නට විය. බුදුරදුන්ගේ අවසරය මත හෙතෙම මෙසේ ප්‍රකාශ කරයි;

"බීජගාම භූතගාම වෘද්ධියට පැමිණෙනුයේ පොළොවෙ නිසා පොළව මත පිහිටාය බාහු බලයෙන් කරනු ලබන කර්මාන්ත ද පොළොවෙ නිසා පොළොව මත පිහිටා සිදු කරනු ලබයි. එපරිද්දෙන්ම රූප ආත්ම කොට ඇති පුද්ගලයා ද රූපයෙහි පිහිටා පින් හෝ පව් රැස් කරයි. වේදනා ...... විඥඥාණ ආත්ම කොට ඇති පුද්ගලයා වේදනාදියේ පිහිටා පින් හෝ පව් රැස්කරයි."

සච්චක, බුදුරදුන් වෙත වාද කරන අදහසින් එළඹ සිටියේ පූර්ව සූදානමක් ඇතිවයි. අට්ඨකථාව ද ආශ්‍රය කරමින් මහාචාර්ය ගුණපාල මලලසේකර මහතා ඒ පිළිබඳව මෙසේ සඳහන් කරයි.[5] සච්චක යනු මජ්ඣිම නිකායේ චූළ සච්චක සහ මහා සච්චක සූත්‍රයන්හි සඳහන් පරිදි බුදුරදුන් සමග දෙවරක්ම සම්මුඛ සාකච්ඡාවන්හි යෙදුණ නිගණ්ඨයෙකි. ඔහුට ආමන්ත්‍රණය කර ඇත්තේ අග්ගිවෙස්සන යන ගෝත්‍ර නාමයෙනි. (අග්නිවෛශ්‍යායන ගෝත්‍රික) බුද්ධඝෝෂ පාදයන් මොහුගේ මාපියන් දෙපල ම නිගණ්ඨයන් බව දක්වා ඇත. ඔවුහු දක්ෂ වාදකරුවෝ වූහ. ඔවුන් විවාහ වූයේ ලිච්ඡවීන්ගේ යෝජනාවක් අනුවය. එයට හේතු වූයේ ඔවුන් වාදයේ දී එකිනෙකා පරාද කිරීමට අසමත් වීමයි. ලිච්ඡවීහු ඔවුන් ජීවත් කළහ. ඔවුන්ට දූවරු සිව්දෙනෙක් වූහ. සච්චා, ලෝලා, පටාචාරා සහ සිවාවතිකා යනුවෙනි. මොවුහු සැරියුත් තෙරුන් සමඟ වාද කළහ. තෙරණුවෝ ඔවුන් අනතුරුව පැවිදි වූ ඔවුහු රහත් වූහ. සච්චක ඔවුන්ගේ කනිටු සොහොයුරා විය. ඔහු ලිච්ඡවීන්ගේ ගුරුවරයෙකු ලෙස වෛශාලියෙහි විසූහ.

සච්චක නුවට පුත්‍රයා මෙන් බුදුරදුන් වෙත වාදාභිමුඛව පැමිණ තවත් පුද්ගලයන් පිළිබඳ වාර්තා සූත්‍ර පිටකයෙහි සඳහන් වෙයි.

උපාලි ගහපති නිගණ්ඨනාථ පුත්තයන්ගේ ධනවත් ගිහි ශ්‍රාවකයෙකි. විපාක දීමෙහි දී කායික වාචසික ක්‍රියාවන් ප්‍රමුඛවේ යැයි ඔහු බුදුරදුන් ඉදිරියේ ප්‍රකාශ කළේය. චෛතිකත්වය - මානසික ක්‍රියාව

අතිශයින් ප්‍රධාන වන බව බුදුහු දේශනා මාර්ගයෙන් පහදා දී උපාලි ගැහැවියා බුද්ධ ශ්‍රාවකයෙකු බවට පත් කළහ.[6]

වච්ඡගොත්ත පරිබ්‍රාජක තෙමේ ආත්ම දෘෂ්ටිය පිළිබඳ නොයෙකුත් ප්‍රශ්න ඇසීමට බුදුරදුන් වෙත පැමිණි අයෙකි. ඔහු ආත්මයක් තිබේද? කිම එය නිත්‍යවේද? ආදි ප්‍රශ්න බුදුරදුන්ගෙන් ඇසීය. එහිදී අන්තවාද තමන් නොපිළිගන්නා බවත්, සියලු සංස්කාර ධර්මයන්හි යථා ස්වභාවය කෙසේ වේදයි පැහැදිලි කරමින් ධර්ම දේශනා කළහ.[7]

කුකුරුරට කම්මාසසදම්ම නියම් ගමෙහි දී තමාගේ මිථ්‍යා ලබ්ධියෙහි දොස් දක්වන බුදුරදුන් කෙරෙහි අමනාපයෙන් සිටි මාගන්දියා නම් පිරිවැජියාට දේශනා කරන ලද්දේ මාගන්දිය සූත්‍රයයි. බුදුහු ඔහුට ඉන්ද්‍රිය සහ ඉන්ද්‍රිය බද්ධ චේතනා පාලනය කර ගැනීමට උපදෙස් දුන්හ. මාගන්දිය තම මිථ්‍යාලබ්ධිය හැර පියා පැවිදි විය.[8]

සභිය සූත්‍රය සුත්ත නිපාත මහාවග්ගයේ හමුවන්නකි. සභිය පරිබ්‍රාජික කතා පුවතෙහි ඔහු වච්ඡගොත්ත සමග සංවාදයක දී තථාගතයන් වහන්සේ පිරිනිවණින් පසු පවතී දැයි යනාදි ප්‍රශ්න සාකච්ඡා කරයි.[9]

කෝසම්බියේ දී ආනන්ද තෙරුන් විසින් සන්දක සූත්‍රය දේශනා කරන ලද්දේ පිරිවැජි සන්දකට සහ ඔහුගේ අනුගාමිකයන්ටය. ආනන්ද තෙරණුවෝ මෙහිදී ඔවුනට අන්‍යධලබ්ධික ශාස්තෘන්ගේ සිව් වැදෑරුම් මිථ්‍යා දෘෂ්ටිය පැහැදලි කළහ. එනම් මරණින් පසු පැවැත්මක් නැත. පින් පව් නැත. සියල්ල අහේතුක ප්‍රත්‍ය වේ. ඇත්තේ හුදෙක් මහාභූත 7 ක එකතුවක් පමණි. යනු මිථ්‍යා ලබ්ධිය යි. ප්‍රතීත්‍ය සමුත්පන්න දේශනාව ඇසීමෙන් පසු සන්දක සහ ඔහුගේ අනුගාමිකයෝ බුද්ධ ශ්‍රාවකයන් බවට පත් වූහ.[10]

නිත්‍ය, ස්ථාවර, සුබද සදාකාලිකත්වය පිළිබඳ මිථ්‍යා ලබ්ධිගත් බක බ්‍රහ්මයා - මහණ, මම නිත්‍ය දෙයට ම නිත්‍යය යි කියමි. ස්ථිර



දෙයටම ස්ථිරය යි කියමි. මෙයට වඩා (බ්‍රහ්මත්වයට වඩා) අනෙක් නිවණක් නැති හෙයින් ම අන් නිවණක් නැතැයි කියමි යි ප්‍රකාශ කරයි.[11]

සච්චක සූත්‍රය අනුවත් එම ගණයෙහි ලා සැලකිය හැකි තවත් බෙහෝ සූත්‍ර දේශනා අනුවත් පැහැදිලි වන කරුණක් නම් තත් කාලීන ජන විඥානය තුළ තදින් මුල්බැසගත් දෘෂ්ටියක් වූයේ ආත්ම දෘෂ්ටිය බවයි. ඖපනිෂදික ආත්මයන් සහ බෞද්ධ අනත්ත ඉගැන්වීම පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක යෙදෙන මහාචාර්ය ඕ.එච්. ද විජේසේකර මහතා ආත්මන් සහ බ්‍රහ්මන් පිළිබඳ ඉගැන්වීම් උපනිෂද් දර්ශනයේ අතිශය වැදගත් මාතෘකාවක් වන්නා සේම පුරාතන පාලි නිකාය ග්‍රන්ථවල (දීඝනිකාය, මජ්ඣිමනිකාය, සුත්තනිපාත, උදානපාලි වැනි) අනත්වාදී න්‍යායවන් එය ප්‍රතික්ෂේප කරනු ලබන බව ද දක්වයි. එසේම සරල සාකච්ඡාවකින් ආත්ම - අනාත්මවාද පැහැදිලි කළනොහැකි බවත් වැඩිදුරටත් සඳහන් කරයි.

ජන්මයෙන් ජන්මයට ගමන් කරන නිරන්තරව ක්‍රියාත්මක වන ආත්මයේ ස්වරූපය විවිධාකාරයෙන් විවරණය කරනු ලැබෙයි. එක් උපමාවක් මෙසේය. තද් යථා තෘණජලායුකා තෘණස්‍යාන්තං ගත්වාන්‍යමාක්‍රමමාක්‍රම්‍යාත්මානමුපසංහරති. එව මෙවායවාත්මෙදං ශරීරං නිහත්‍යාවිද්‍යාං ගමයිත්වාන්‍යමාක්‍රම මාක්‍රම්‍යාත්මමානමුපසංහරති. (බෘහදාරණ්‍යක 4,4,3)

(යම් සේ කුඩැල්ලා තණපතක් අගට ගොස් අන් තණපතක් අල්වා ගෙන ඒ කරා තමා ඇද ගනී ද එසේ ම මේ ආත්මය සංසාරික පූර්ව ශරීරය ඉවත් කොට, එය අචේතන බවට පමුණුවා අන්‍ය ශරීරයක් කරා ගොස් ඒ වෙත තමා ඇද ගනී)

ආත්මයන් ශබ්දයාගේ වෛදික ප්‍රයෝගානුසාරයෙන් කරනු ලබන විමර්ශනයක් දඹදිව පැරණි සාහිත්‍යය[12] නම් කෘතියෙහි සැකෙවින් දක්වා තිබේ. ඒ අනුව ආත්මන් ශබ්දයාගේ අර්ථ විකාශනයෙහි අවස්ථා කිහිපයක් ඇති බව පෙනේ. ප්‍රථමයෙන් ම යමෙකුගේ ස්ථූල ශරීරය යනු

ආත්මන් ශබ්දයෙන් වාච්‍ය විය. "ආත්මන්" හෝ "ත්මනා" යනාදි වශයෙන් ඍග්වේදයෙහි නොයෙක් තන්හි (අසවල්) තෙමේ නොහොත් (යමෙක්) තෙමේ යන අර්ථය ද ප්‍රතීයමාන වේ. දෙවැනිව යමෙකුගේ ජීවිතාවසානය දක්වා අංග ප්‍රත්‍යාංගයක් නැර සකල ශරීරයෙහිම පැකිර පවත්නා වූ ප්‍රාණය යන අර්ථයක් ප්‍රකාශ විය. කිසි විටෙක ආත්මන් ශබ්දයෙන් ප්‍රාණදායක ශක්තිය යන අරුත ද පළ විය. තුන් වැනිව ඉන්ද්‍රියඥානය බද්ධ භාජන නොහොත් සන්නිධි භූත වූ (The Receptacle Sense Perceptions) මනඃ යනු ද සිව් වැනිව ඉන්ද්‍රිය ඥාන විෂයෙහි විවේක ලක්ෂණාපෙත වූ මුඛ්‍ය අන්තඃකරණ සංඛ්‍යාත වූ විඥානමය පුරුෂයා යනු ද පස්වැනිව ක්‍රියාමය වූ ද අක්‍රියාමය වූ ද චෛතන්‍ය මාත්‍රය යනු ද, සවැනිව සත්තාවෙහි අව්‍යක්ත ස්වරූපය වූ පරම සත් වූ ආනන්දවත් වූ පරමාත්මය හා විභාග කට නොහැකි වූ විශුද්ධාත්මය යනු ද ආත්මන් ශබ්දයෙන් වාච්‍ය විය.

මේ ආත්මන් ශබ්දයේ ඓතිහාසික තත්ව නිරූපණය, එහි විවිධ ස්වරූපයන් හඳුනා ගැනීම තුළින් පැහැදිලි වන්නේ ඒ පිළිබඳ විවිධ මතාන්තර පැවති බවයි. මෙම චෛතන්‍ය ස්වභාවයේ ප්‍රාථමික අවස්ථාව සච්චක නිගණ්ඨ පුත්‍රයාගේ ආත්මවාදය තුළ පිළිබිඹු වෙතැයි සිතිය හැකිය.

ආත්මවාදය නිසා හටගත් සත්කාය දෘෂ්ටිය ඛණ්ඩනය කිරීම සඳහා තථාගතයන් වහන්සේට බොහෝ සූත්‍ර දේශනා කරන්නට සිදු වූ බව අදාළ ඓතිහාසික වාර්තාවන්ගෙන් පෙනේ. මජ්ඣිම නිකායේ මූලපරියාය සූත්‍රය ද ඒ සඳහා නිදසුනකි. එහිදී ත්‍රිවේදයේ පරතෙරට පත් භික්ෂූන් පන්සීයක් දෙනා අරබයා ඔවුන්ගේ මාන්නය බිඳ සක්කාය දිට්ඨියට මුල්වන කාරණය දේශනා කළ ද දේශනාවසානයෙහි ඔවුහු මනාප නොවූහ.

තෘෂ්ණාවත් අවිද්‍යාවත් හේතු කරගනිමින් මමය, මගේය යන හැඟීම සියලු දුක් හට ගැනීමේ හේතුව බවත් රූප, වේදනාදි සංස්කාර



ධර්මයන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් බැලීම සියලු දුක් නැති කිරීමට, කෙලෙසුන්ගෙන් මිදීමට මාර්ගය බවත් චූළතණ්හාසංඛය සූත්‍රය (ම.නි. 1.4.7) මහාපදාන සූත්‍රය (දී.නි.2.1)ආදියෙහි ද දේශනා කර ඇත.

අස්මි මානය නම් පෘථග්ජන අවස්ථාවේ සිට අනාගාමී අවස්ථාව දක්වාම රූපාදි ස්කන්ධයන් ගැන මමය, මගේය යන හැඟීම් ඇතිවයි. රූපය මමය, වේදනාව මම යනුවෙන් ඇති කර ගන්නා දෘෂ්ටිගතිකත්වය සක්කාය දිට්ඨියයි. එය ක්ලේශයකි. එම ක්ලේශය (දෘෂ්ටිය) සෝවාන් මාර්ගයෙන් ප්‍රහීන වෙයි. මේ දෙකෙහි වෙනස පිළිබඳව බලන්න. (කෙලෙස් එක් දහස් පන්සියය)

පශ්චාත්තන, බෞද්ධ සාහිත්‍යය තුළ ද අන්තවාද, සක්කායදිට්ඨි දෝංකාරය සංවාද ස්වරූපයෙන් පැවති බවට නිදසුන් කථාවත්ථුප්පකරණ, මිලින්දපඤ්හ වැනි ග්‍රන්ථවලින් දැනගත හැකිය. පරවාද පන්සියක් සහ සකවාද පන්සීයයක් සංග්‍රහ කරමින් කථාවත්ථුප්පකරණය රචනා කර ඇත. "රූප නිච්චං ධූවං සස්සතං අවිපරිනාම ධම්මං, රූපය නිත්‍යය, ස්කදන්තය, ශාස්වතය, විපරිණාම නොවන්නේ ය.......... එසේ නොකිය යුතු ...... පුග්ගලො නූපලබ්භති සච්චිකත්ථපරමත්ථේන - ආමන්තා - සත්‍ය වශයෙන්, පරමාර්ථ වහයෙන් පුද්ගලයෙකු නොලැබේ. එසේය, යනාදි විචිත්‍ර වාද ක්‍රමය විස්තෘත රූපයෙන් පුද්ගල දෘෂ්ටිය විවේචනය කරයි. (පුග්ගලකථා - කථාවත්ථුප්පකරණ)" මිලින්ද ප්‍රශ්නයේ මිලිඳු රජ - ස්වාමිනි, නාගසේනයන් වහන්ස වෙදගු ඇද්ද, ලැබේදැයි විචාළේය......තොප කී වෙදගු නම් කවුරු ද? ස්වාමීනි, අභ්‍යන්තරයෙහි යම් ප්‍රාණ ජීවියෙක් තෙම ඇසින් රූප දකී ද?................. මහණෙනි, ඇස නිසාත් රූපය නිසාත් චක්ෂු විඥානය උපදන්නේය...... මේ ශරීරාභ්‍යාන්තරයෙහි වෙදගු නම් ජීවියෙක් නොලැබෙයි.

(මිලි.ප්‍ර. තෘතිය වර්ගය)

ප්‍රස්තුත සච්චක සූත්‍රයෙහි බුදුරාජාණන් වහන්සේ මම රූප මගේ ආත්මය යි කියම් යනාදි සච්චකගේ මිථ්‍යාලබ්ධියෙහි දොස්

දක්වමින් - එසේ නම්, ගිනිවෙස්න, රූප මගේ ආත්මය යි මෙසේ යමක් තෝ කියහි ද මගේ රූප මෙසේ වේවා, මෙසේ නොවේවා යි තාගේ බලය ඒ රූපයෙහි පවත්නේ ද? උපමා උපමේය දක්වමින් බුදුරදුන් මෙසේ ප්‍රශ්න කිරීමෙහි දී තමාගේ දෘෂ්ටිය වැරදි බව ඔහුට පිළිගැනීමට සිදුවෙයි. ඒ අනුසාරයෙන් රූපාදිය අනිත්‍ය දුක්ඛ අනාත්ම ලක්ෂණයන්ගෙන් යුක්ත බවත් , එබැවින් ම යමක් අනිත්‍ය වේ නම්, දුක් වේ නම් පෙරලෙනසුලු වේ නම් මෙය මට අයත් ය. මම මේය, මේ මගේ ආත්මයයි, තෘෂ්ණා මාන දෘෂ්ටි වශයෙන් ගතයුතු නොවන්නේ යැයි ඔහුට පිළිගැනීමට සිදුවෙයි. එසේ ම අන්තිම වශයෙන් ගිනිවෙස්න, තෝ කුමක් සිතන්නෙහි ද? දුකෙහි ඇලුණු, දුකට පැමිණි, දුකට බැසගත් යමෙක් ඒ දුක මේ මා සතුය. මම මේය. මේ මාගේ ආත්මයය යි, දක්නේ නේ නම් හෙතෙමේ පංචස්කන්ධ දුඃඛය (අනිත්‍යාදි වශයෙන්) දක්නේ හෝ වේද දුක හෝ ගෙවා වාසය කරන්නේ වේ දැයි ප්‍රශ්න කරති. එවිට සච්චක ඔහු අනිත්‍යාදි වශයෙන් පංචස්කන්ධ දුඃඛය නොදනී. ඔහු සාංසාරික දුක් ගෙවා නොදමන්නේය යනු පිළිගැනීමට සිදු වෙයි.

ඓතිහාසික වූත් ගතානුගතික වූත්, චිත්ත ප්‍රවාහයේ පරිවර්තනීය සහ සාධනීය විප්ලවයක් ආරම්භ වූයේ බුදුරදුන් ලොව පහළ වීමත් සමග යැයි තදීය විෂයාන්තර දැනුමැත්තන්ගේ පිළිගැනීමයි. දර්ශනවාද විෂයෙහි ප්‍රමාණ ශාස්ත්‍රීය මාපකයන් අතර අග්‍රස්ථායී ප්‍රත්‍යක්ෂ ප්‍රමාණය බොහෝ වාද විවාදයන් මගින් ජන විඥානය ප්‍රබෝධමත් කිරීමට හේතු විය. පච්චත්තං වේදිතබ්බෝ යන ධර්මයෙහි උපපදය ස්වාධීන චින්තනයකට මං හෙළි කරයි. ලෞකික සැප සම්පත් නිස්සාර කොට, ශරීරය පිළිකුල් කොට, ජීවිතයේ දුක් පිළිබඳ අවධානය බුද්ධ කාලයට මෑත [illegible]යෙහි වූ මෛත්‍රායණී වැනි උපනිෂදයන්හි[14] දක්නට ඇත.

ප්‍රස්තුත සූත්‍රයෙහි තථාගතයන් වහන්සේ සමග වාදාභිමුඛ වූ සච්චකගේ සල්ලාපය ඔහුගේ ශ්‍රද්ධා විහීනත්වයත් පරාජය භාරගැනීමේ



අකමැත්තත් පෙන්නුම් කරන අතර, ඔහු විමුක්තියේ ප්‍රවාහයට යොමු වන අයුරු ද අට්ඨකථාවෙහි විස්තර වෙයි.

i. සමණො ගොතමො - ශ්‍රමණ ගෞතමයන් යනුවෙන් සච්චකගේ ඇමතීම බුදුරදුන් කෙරෙහි ගරු සරු නැති ආමන්ත්‍රණයකි. මිථ්‍යාලබ්ධි ගත්තවුන් බුදුරදුන්ට මෙසේ ආමන්ත්‍රණය කර ඇත.

ii. අපේපවනාම සියා කොචිදෙව කථා සල්ලාපො, අපේපවනාම තස්මා පාපකා දිට්ඨිගතා විවෙචෙය්‍යාමාති - (ඒ භවත් ගෞතමයන් හා) කිසියම් කතා බිණීමක් වන්නේ නම් යෙහෙකි. ඒ පවිටු මිථ්‍යා දෘෂ්ටියෙන් ඔහු ගලවා ගන්නේ නම් යෙහෙකි. කියාපි.

iii. සෙය්‍යථාපි නාම බලවා පුරිසො දීඝලොමිකං එළකං ලොමෙසු ගහෙත්වා ආකඩ්ඪෙය්‍ය, පරිකඩ්ඪෙය්‍ය, සම්පරිකඩ්ඪෙය්‍ය, එවමෙවාහං සමණං ගොතමං වාදේන වාදං ආකඩ්ඪිස්සාමි, පරිකඩ්ඪිස්සාමි, සම්පරිකඩ්ඪිස්සාමි - යම්සේ බලවත් පුරුෂයෙක් දික් ලොම් ඇති එළුවෙකු උගේ ලොමින් අල්ලා ඔබමොබ ඇද නැවතත් ඇද (පීඩා කෙරේද) එසෙයින් ම මම මහණ ගෞතමයන් වාදයෙන් වාද කොට ඔබ්නොබ ඇද නැවත නැවතත් ඇද දමන්නෙමි. කියාපි.

iv. එවං වුත්තෙ සච්චකො නිගණ්ඨපුතතේතා තුණ්හී අහොසි - වාදයෙන් පරාජයට පත් වූ සච්චක එය පිළිගැනීමට නොකැමැතිව නිහඬව සිටියේයය.

v. පරාජිතව බිමබලා සිටි තමන්ගේ වාද නායකයා වූ සච්චක අඬු කඩා දැමූ කකුළුවෙකු මෙනැයි දුර්මුඛ නම් ලිච්ඡවි නිග්‍රහ කරද්දී - ඉධ මයං හොතා ගොතමෙන සද්ධිං මන්තේම - දුර්මුඛය ඉවත් වනු අපි භවත් ගෞතමයන් සමග වාද කරමු. තා සමග නොවේ. යනුවෙන් තම ශ්‍රේෂ්ඨත්වය පළකරයි.

vi. දේශනාවසානයෙහි සච්චක භික්ෂු සංඝයා සහිත තථාගතයන් වහන්සේ සියතින් දන් වළඳවයි. ඔහු දෙන ලද දානය ඔහුට දෙන ලද්දේ ලිච්ඡවීන් විසිනි. එබැවින් එහි පුණ්‍ය ඵලය - පරිවාරය එම දායකයින්ට ම වේවා යි බුදුරදුන්ට දන්වයි.

02 MAY 2012

යදිදං හෝ ගෝතම දානේ පුඤ්ඤං පුඤ්ඤමහී ච තං දායකානං සුඛාය හෝතුති - යනුවෙනි.

මේ සියලු ම අවස්ථාවන්හි බුදුරදුන් පිළිතුරු දුන් නමුත් සූත්‍රාවසානයෙහි සච්චක මනාපයට පත්වූ බවක් නොදැක්වෙයි. තදට්ඨකතාවෙහි සඳහන් පරිදි මේ නුවට තෙමේ ධර්මාවබෝධය නොකෙළේය. පැවිදි නොවීය. සරණ නොගියේය. භාග්‍යවතුන් වහන්සේ මොහුට ධර්මය දේශනා කළේ අනාගත වාසනාව පිණිසය.

පසු ආත්ම භවයක බුද්ධ පරිනිර්වාණයෙන් බොහෝ කලකට පසු සච්චක තෙමේ කාල බුද්ධ රක්ඛිත නමින් ඉපදී පැවිදිව රහත් වී යැයි ද පැවසේ. මහා උම්මග්ග ජාතකයෙහි හමුවන සේනක යනු සච්චක ලෙස ද හඳුන්වනු ලැබේ.[15]

- අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ත්‍රිලක්ෂණ දේශනාවෙන් පසු දමනය වූ සච්චක බුදුරදුන්ගේ ආර්ය පුද්ගලයන් ගැන විමසීය.

කිත්තාවතා නු බො හොතො ගොතමස්ස සාවකො සාසනකරො හොති ඔවාදපතිකරො තිණ්ණවිචිකිච්ඡො විගතකථංකථො වෙසාරජ්ජප්පත්තො අපරප්පච්චයො සත්ථුසාසනෙ විහරති?

මේ සෙඛභූමිය පිළිබඳව කරනු ලබන විමසීමයි. භවත් ගෞතමයන්ගේ ශ්‍රාවකයා ශාසනයෙහි කෙසේ නම් පිළිපදනේ දැ යි සච්චක විමසයි. සෙඛභූමියෙහි - සෝවාන් ඵලය ලබන පුද්ගලයා හැඳින්වීමට ධර්මයෙහි උප පද මාලාවක් යෙදී තිබේ. දිට්ඨධම්මො, පත්තධම්මො, විදිතධම්මො - ආදියයි. දිට්ඨධම්මො - (සෝවාන් පුද්ගලයා) සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස යන සංයෝජන තුන ප්‍රහීණ කර ධර්මය දුටු, පත්තධම්මො - නිවන් මගට පත්, විදිත ධම්මො - දෙගිඩියාවෙන් එතෙර වුණු, විගතකථං කථො - කුමක් කෙසේ වේදැයි යනාදි සැකය පහවුණු වෙසාරජ්ජප්පත්තො - විශාරද



බවට - නුවණැති බවට පත්, අපරප්පච්චයො - ගුරුපදේශයක් නැතිව පවා නිවන් දැකිය හැකි යන අර්ථයි.

**අසේඛ භූමිය විමසන සච්චක තෙමේ**

කිත්තාවතා පන හො ගෞතම භික්ඛු අරහා හොති ඛීණාසවෝ වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්ත සදත්ථො පරික්ඛීණා භව සඤ්ඤෝජනො සම්මදඤ්ඤා විමුත්තො - යි අසයි.

ඛීණාසවො - කාමාසව, භවාසය, දිට්ඨාසව, අවිජ්ජාසව ක්ෂය කළ[16]
වුසිතවා - බ්‍රහ්මචර්ය වාසය නිමකළ
කතකරණීයො- සිවු මගින් කළ 16 වැදෑරුම් ඥාන කෘත්‍යය ඇති (සොළසකදාණචරියා - අනිච්චානුපස්සනා, දුක්ඛානුපස්සනා, නිබ්බිදානුපස්සනා, විරාගනුපස්සනා..........[17])

ඔහිත භරො - බහා තැබූ කෙළෙස් බර ඇති
අනුප්පත්තසදත්ථො - අර්හත් ඵල සංඛ්‍යාත ස්වාර්ථයට පත්
පරික්ඛීණ භව සඤ්ඤොජනො - ක්ෂය කළ බව බන්ධන ඇති.[18]
සම්මදක්ඤා විමුත්තො - මනාකොට නුවණින් දැන නිස්සරණ විමුක්තියෙන් විමුක්ත වූ රහතුන් වහන්සේ - ක්ලේශ ප්‍රහාණය පස් ආකාරයකින් සිදු වේ.

1. වික්ඛම්භන පහාන - පංච නීවරණයන් තාවකාලිකව ප්‍රහීණ කිරීමයි (ධ්‍යාන අවස්ථාව)
2. තදංගප්පහාන - විරුද්ධ මාර්ගයෙන් ප්‍රහීණ කිරීමයි
3. සමුච්ඡේදප්පහාන - විනාශ කිරීමෙයෙන් ප්‍රහීණ කිරීමයි
4. පටිප්පස්සද්ධිපහාන - සමාධි ප්‍රබෝධයෙන් ප්‍රහීණ කිරීමයි
5. නිස්සරණප්පහාන - සපුරා ඉවත් කිරීමෙන් ප්‍රහීණ කිරීමයි[19]

විමුක්ත සිත් ඇත්තහු දස්සනානුත්තරිය, පටිපදානුත්තරිය, විමුත්තානුසරිය යන තුන් අනුත්තරිය ගුණයෙන් යුක්ත වෙති යි වදාළහ.

සච්චක සූත්‍රයෙහි අවසාන භාගයෙහි හමුවන මේ අරහන්ත ලක්‍ෂණ අර්ථ විභාගය අට්ඨකථාවෙහි දැක්වෙන්නේ

*ලොකියා ලොකුත්තරා පඤ්ඤා*

*ලොකියා ලොකුත්තරා පටිපදා*

*ලොකියා ලොකුත්තරා විමුක්ති කියායි.*

දස්සනානුත්තරිය යනු අරහත්තමග්ග කියාද, සෙස මග්ගං පටිපදානුත්තරිය කියාද, මග්ගඵල විමුක්තිය විමුක්තානුත්තරිය කියාද තවදුරටත් ක්ෂීණාශ්‍රවයන්ගේ නිර්වාණ දර්ශනය දස්සානුත්තරිය ලෙසත්, මාර්ගාංග අට පටිපදානුත්තරිය ලෙසත්, අග්ගඵලය විමුත්තානුත්තරිය ලෙසත් දැක්වේ.



## පාදක සටහන්

1 හුදෙක් තම තමා අයත් ප්‍රත්‍යයෙන් පවත්නා කල්හි ව්‍යවහාර මාත්‍රයෙන් දුක්විඳීයයි කියායි.

*දුක්ඛමෙව හි න කොචි දුකඛිතො*
*කාරකො න කිරියා ව විජ්ජති*
*අත්‍ථි නිබ්බුති න නිබ්බුතා පුබා*
*මග්ගමත්‍ථි ගමකො න විජ්ජති*

විසුද්ධිමග්ග - සත්‍ය නිර්දේශය සිංහල විශුද්ධිමාර්ගය, පණ්ඩිත මාතර ශ්‍රී ධර්මංශ ස්ථවිර, මාතර වෙළෙන්දෝ මුද්‍රණාලය - 1959

2 බලන්න - An Aspect of Upanisatic Atman and Buddhist "Anatta". Buddhist and Vedic Studies, P 257, Prof, O.H. De. A. Wijesekara. Edited by Prof. M.H.F. Jayasuriya. Delhi, 1994..

3 බලන්න - Jaina Literature, History of Indian Literature, Vol It. P.408 M. Winternity, Delhi, 1993.

4 විසි වැදෑරුම් සක්කාය දිට්ඨි - සඳහා බලන්න - Sakkaya Ditthi, Buddhist Dictionary, Nayanatilaka, Buddhist Publication Society, Kandy, 1998

5 Saccaka - Dictionary of pali proper Names. Prof. G..P. Malalasekara.

6 මජ්ඣිම නිකාය 2 - ගහපතිවග්ග, උපාලිසුත්ත

7 එම - පරිබ්බාජකවග්ග - අග්ගිවච්ඡගොත්ත

8 එම - එම - මාගන්දිය සුත්ත

9 SABHIYA sutta - DPPN

10 මජ්. නි. 1 පරිබ්බාජකවග්ග - සච්චක සුත්ත

11 මජ්. නි. 2 චූළයමක වග්ග - බ්‍රහ්මනිමන්තික සුත්ත

12 දඹදිව පැරණි සාහිත්‍යය - 59 පිට, ඩී. ඊ. හෙට්ටිආරච්චි, කොළඹ, 1946

13 66 - අස්මිමානො - කෙළෙස් එක්දහස් පන්සියය, රේරුකානේ චන්‍දවිමල මහා ස්ථවිර, මුද්‍ර. දෙපානම, පන්නිපිටිය, 1990

14 දඹදිව පැරණි සාහිත්‍ය, 67 පිට, ඩී. ඊ. හෙට්ටිආරච්චි සහ පශ්චාත්තන උපනිෂද් පිළිබඳ විග්‍රහය, හින්දු සමය සහ බුදු සමය II, 345 පිට සිට, සහ එම 351 පිට, ශංකරාචාර්ය - ප්‍රච්ඡන්න බෞද්ධ චාල්ස් එලියට්, අධ්‍යාපන දෙ. ප්‍ර. 1967

15 Saccaka sutta - DPPN

16 ම.නි. 1. 2. සබ්බාසව සුත්ත

17 සිංහල විශුද්ධි මාර්ගය, ප්‍රඥාභාවනානිශංස නිර්දේශය, 1115 - 16 පිටු, පණ්ඩිත මාතර ශ්‍රී ධර්මවංශ හිමි, 1959

18 SAMYOJANA, Buddhist Dictionary, 1988 Nyanatilaka.

19 ඤාණදස්සන විසුද්ධි විසුද්ධිමග්ග, XXII